" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE


204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary

දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000



SLSI ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01


මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/ADM/18-38/FI/05-2023 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } දිනය / திகதி / Date } 2023.07. 04

**පාලන චක්‍රලේඛ : 03/2023**

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි, නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

<u>රාජකාරි කටයුතු සඳහා ලිපි ආමන්ත්‍රණයේ දී ධූරාවලිය අනුව කටයුතු කිරීම.</u>

බස්නාහිර පළාත ඇතුලත, පළාතෙන් පිටත හා රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු සමඟ රාජකාරි කටයුතු සඳහා ලිපි ගනුදෙනු කිරීමේ දී නියමිත ධූරාවලියට පටහැනිව විවිධ ආකාරයෙන් ලිපි ආමන්ත්‍රණය කිරීම සම්බන්ධව මගේ අංක CSWP/ADM/18-38/FI/05 හා 2019.09.24 දිනැති ලිපිය මඟින් උපදෙස් ලබා දී තිබුණද, ඒ සම්බන්ධයෙන් නිලධාරීන් නිසි සැලකිල්ලකින් යුතුව කටයුතු නොකරන බවට ඇතැම් ලිපි ගනුදෙනු පරීක්ෂාවේ දී පැහැදිලි වේ.

02. ඒ අනුව රාජකාරි ලිපි ගනුදෙනු කිරීමේ දී නියමිත ධූරාවලිය අනුව කටයුතු කල යුතු බව නැවත වරක් අවධාරණය කරමි. මේ සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමු කර, උක්ත උපදෙස් ප්‍රකාරව කටයුතු කරන ලෙස ඔබ යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු / ආයතන නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

03. එසේම ඔබ හා ඔබ හා යටතේ ඇති ආයතන මඟින් ඉටුකරන රාජකාරි කටයුතුවල වගකීම සෘජුව ඔබ වෙත පැවරෙන අතර, අවස්ථා ගණනාවක දී එකී වගකීම පැහැර හැර ඇති බව ඉදිරිපත් වන ගැටළු අනුව පෙනීයන බැවින් මේ සම්බන්ධයෙන් ද අඛණ්ඩව පසුවිපරම් කර ඔබගේ රාජකාරි වගකීමෙන් යුතුව ඉටු කිරීමට වගබලා ගන්නා ලෙසත් එසේ කරන ලෙස ඔබගේ සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.